# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2000 අංක 12 දරන ශ්‍රී ලංකාවේ අක්ෂි වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2000 මැයි මස 08 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 මැයි මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**2000 අංක 12 දරන ශ්‍රී ලංකාවේ අක්ෂි වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2000 මැයි මස 08 වන දින]

එල්. ඩී.– ඕ. 10/96.

**ශ්‍රී ලංකාවේ අක්ෂි වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ශ්‍රී ලංකාවේ අක්ෂි වෛද්‍යවරුන්ගේ විද්‍යාලය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක් මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී විද්‍යාලයේ කටයුතු හා පරමාර්ථ මෙතෙක් කල් විද්‍යාලයේ සභාව විසින් කළමනාකරණය කර ගෙන යනු ලැබ ඇති හෙයින් ද :

එකී විද්‍යාලයේ සභාව විසින් සංස්ථාගත කිරීම සඳහා ඉල්ලුම් කර ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2000 අංක 12 දරන ශ්‍රී ලංකාවේ අක්ෂි වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකාවේ අක්ෂි වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ සභාව සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට සහ ඉන් පසුව, මීට පෙරාතුව සිටි සභාපතිවරයා සහ දැනට ධුර දරන සභාපතිවරයා, උපසභාපතිවරයා ලේකම්වරු, භාණ්ඩාගාරිකවරයා, කර්තෘවරයන් දෙදෙනෙක් සහ කාරක සභිකයන් සතර දෙනෙක් යන අයගෙන් සමන්විත වූ ශ්‍රී ලංකාවේ අක්ෂි වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ සභාවේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් "ශ්‍රී ලංකාවේ අක්ෂි වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ සභාව" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු 'සංස්ථාව' යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තවද පොදු මුද්‍රාවක් තබාගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද සම්පූර්ණ බලය හා අධිකාරය ද ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** මෙම සංස්ථාව සංස්ථාපනය කිරීමේ පොදු පරමාර්ථ මෙසේ යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) අක්ෂි වෛද්‍ය විද්‍යාවේ උසස් සායනික ව්‍යවහාරයන් පවත්වා ගැනීම සුරක්ෂිත කිරීම ;

(ආ) අක්ෂි වෛද්‍ය විද්‍යාත්මක අධ්‍යාපනය, පුහුණුව හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) ශ්‍රී ලංකාවේ ජනතාව අතර, අන්ධභාවය හා දෘශ්‍ය අබලතාව නිවාරණයට අදාළ කටයුතු ආරම්භ කිරීම හා ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) අක්ෂි වෛද්‍ය විද්‍යාව ආශ්‍රිත විෂයයන්හි නියුක්ත පුද්ගලයන් අතර සහයෝගීතාව, සම්බන්ධීකරණය හා සහෝදරත්වය ප්‍රවර්ධනය කිරීම ;

(ඉ) ජාත්‍යන්තර භාවිතයෙහි පවත්නා වඩාත් දියුණු අක්ෂි වෛද්‍ය විද්‍යාත්මක ප්‍රතිකාර ක්‍රම ශ්‍රී ලංකාවට හඳුන්වා දීම ;

(ඊ) වෙනත් ජාත්‍යන්තර තත්ත්වයේ අක්ෂි වෛද්‍ය විද්‍යාල හෝ සංවිධාන අතර කිට්ටු සහායකත්වයෙන් හා සහයෝගීතාවයෙන් කටයුතු කිරීම ;

(උ) අක්ෂි සෞඛ්‍ය ආරක්ෂක වැඩ සටහන් සකස් කිරීමේ දී හා අන්ධභාවය හා දෘශ්‍ය අබලතාව නිවාරණය සඳහා ජාතික සැලැස්මක් සකස් කිරීමේ දී, ශ්‍රී ලංකාණ්ඩුවට උපදෙස් දීම හා ආධාර කිරීම ;

(ඌ) පූර්වෝක්ත පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා සුදුසු යයි සංස්ථාව විසින් සලකනු ලබන යම් සඟරාවක්, පොතක් හෝ වෙනත් ඒ ආකාර ප්‍රකාශනයක් මුද්‍රණය කිරීම, පළ කිරීම හා බෙදා හැරීම ;

(එ) අක්ෂි වෛද්‍ය විද්‍යාව ඉගෙනීම සඳහා ශිෂ්‍යත්ව සැපයීම, එකී ශිෂ්‍යත්ව සඳහා ධනය ප්‍රදානය කිරීම හා ආධාර කිරීම ; සහ

(ඒ) ඉහත සඳහන් පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ආනුෂංගික හෝ හිතකර වන්නා වූ හෝ ඒ ආකාර වෙනත් සියලු කටයුතු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව, බැංකු ගිණුම් පවත්වා ගෙන යාමේ සහ අවසන් කිරීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් සහ වෙනත් ආධාර භාර ගැනීමේ හෝ එකතු කිරීමේ ද, තම අරමුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවට පවරන ලද හෝ සංස්ථාව විසින් අත්කර ගන්නා ලද හෝ සංස්ථාවට අයත් හෝ යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක් තැනීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයේ යෙදීමේ, සේවයේ නියුක්ත කිරීමේ හා අස් කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ සියල්ලක් හෝ ඉන් කිසියම් එකක් හෝ ප්‍රවර්ධනයට හෝ වැඩිදියුණු කිරීමට හෝ අවශ්‍ය, හිතකර හෝ අවස්ථානුකූල සියලු කටයුතු, කාරණා හා දේ කිරීමේ සහ ඉටු කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**5.** (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය හා එහි පරමාර්ථ ඉටු කිරීම සඳහා සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ සිටින්නා වූ ද ඡන්දය දීමට හිමිකම් ඇත්තා වූ ද සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට පටහැනි නොවන රීති කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එසේ සාදනු ලැබූ යම් රීතියක් එය සාදනු ලැබූ ප්‍රකාරව ම, එවැනිම රැස්වීමක දී වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හා එය සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කළ හැකි ය.

(2) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනට පෙරාතුව ම වූ දිනයෙහි ක්‍රියාත්මකව පැවති ශ්‍රී ලංකාවේ අක්ෂි වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ රීති, මෙම පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් සමග අනනුකූල නොවනතාක් දුරට මෙම වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති ලෙස සැලකිය යුත්තේ ය.

(3) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුත්තාහ.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අය විය යුතු ණය.

**6.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ශ්‍රී ලංකාවේ අක්ෂි වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ පැවැති සියලු ණය හා බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට විද්‍යාලයට අයවිය යුතු සියලු ණය හා විද්‍යාලයට ගෙවිය යුතු දායක මුදල්, ආධාර මුදල් මෙම පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් නිශ්චල හා චංචල දේපළ දැරිය හැකි සහ බැහැර කළ හැකි බව.

**7.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, පරිත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් ලබා ගැනීමට හා දැරීමට සංස්ථාවේ රීතිවලට යටත්ව නීත්‍යානුකූලව සංස්ථාවට බලය ඇත්තේ ය. තව ද එම දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව සංස්ථාව විසින් මෙම පනතේ කාර්යය සඳහා සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්වන රීතිවලට යටත්ව එකී සියලු දේපළ දැරිය යුතු ය.

ප්‍රයෝජනයට ගත හැක්කේ කෙසේද යන වග.

**8.** සංස්ථාවේ ආදායම හා දේපළ හුදෙක් ම මෙහි දක්වා ඇති පරිදි වූ සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා ම යොදා ගත යුතු අතර, ඉන් කිසිත් කොටසක් සංස්ථාවේ යම් සාමාජිකයකුට ලාභාංශ, ණය, ප්‍රසාද මුදල්, ලාභ වශයෙන් හෝ වෙනත් ආකාරයකින් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය :

එසේ වුව ද,–

(අ) සංස්ථාවට කරන ලද යම් සේවාවක් වෙනුවෙන් සංස්ථාවේ යම් නිලධරයකුට හෝ සේවකයකුට හෝ සංස්ථාවේ යම් සාමාජිකයකුට සද්භාවයෙන් යම් සාධාරණ සහ ප්‍රමාණවත් පාරිශ්‍රමික ගෙවීම ;

(ආ) සංස්ථාවේ යම් සාමාජිකයකු විසින් හෝ සංස්ථාවේ සාමාජිකයකු කොටස් හිමියකු වන යම් ව්‍යාපාරික සමාගමක් විසින් සංස්ථාවට බද්දට දී තිබෙන ස්ථානයක් සඳහා සාධාරණ හා ප්‍රමාණවත් කුලියක් ගෙවීම ; සහ

(ඇ) තම කර්තව්‍ය හෝ කාර්ය ඉටු කිරීමෙහිලා හෝ සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමෙහි ලා සංස්ථාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින් සංස්ථාවෙන් කලින් ලබාගත් අනුමැතිය ඇතිව දරන ලද සාධාරණ හා නිසි වියදම් ප්‍රතිපූරණය කිරීම හෝ ආපසු ගෙවීම

මෙම වගන්තියේ විධිවිධාන මගින් තහනම් නොකෙරේ.

9. සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ රීති වලින් විධිවිධාන සලසා ඇති තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරියේ මිස, කිසියම් සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඔවුන් විසින් තමන් ඉදිරියේ එකී මුද්‍රාව තබන ලද බවට ලකුණක් වශයෙන් එහි තම අත්සන යෙදිය යුතු ය. තව ද එම අත්සන් කිරීම යම් තැනැත්තකු විසින් සාක්ෂිකරුවකු වශයෙන් අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

10. මෙම පනතේ සඳහන් තැනැත්තන් හා ඔවුන් වෙතින්, ඔවුන් මගින් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නන්ගේ අයිතිවාසිකම් වලට හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය. ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

11. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.